සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 9 - 2019

නම : ..............................................  සිංහල භාෂාව හා සාහිත්‍යය  කාලය : පැය 02 යි.

## I කොටස

සැළකිය යුතුයි :
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01, 02 හා 03 ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) සම්මත සිංහල අක්ෂර මාලාවේ වර්ගාක්ෂර සංඛ්‍යාව
(i) 10කි (ii) 42කි (iii) 25කි (iv) 18කි

(2) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදයක් වන්නේ,
(i) ලේඛණ (ii) කනිෂ්ඨ (iii) ආවේනික (iv) පුනර්බව

(3) (i) ශාසන (ii) ප්‍රකාශණ (iii) තරුන (iv) කැළණි

- **අංක 04 සිට 05 තෙක් ප්‍රශ්නවලට ඉරි ඇඳි ක්‍රියාපද කුමන ක්‍රියා වර්ගයට අයත්දැයි තෝරා යටින් ඉරක් අඳින්න.**

(4) තාත්තා අවවාද <u>කරද්දී</u> මල්ලී නිහඬව සිටියේය.
(i) විධි ක්‍රියා (ii) මිශ්‍ර ක්‍රියා (iii) අසම්භාව්‍ය ක්‍රියා (iv) පූර්ව ක්‍රියා

(5) අම්මා නංගී ලවා රෙදි සෝදවයි.
(i) පූර්ව ක්‍රියා (ii) ප්‍රයෝජ්‍ය ක්‍රියා (iii) මිශ්‍ර ක්‍රියා (iv) විධි ක්‍රියා

(6) පහත පදවලට අනුක්ත පද ලියන්න.
(i) ගායකයෙක් .......................................... (ii) ළමයා ..........................................

(7) පහත දී ඇති වාක්‍ය නිවැරදි කර නැවත ලියන්න.
(i) සමහරෙක් දේශීය නැටුම් කලාවට කැමැත්තක් දක්වයි. ..........................................
(ii) තුරු ලතාවෝ පරිසරය අලංකාර කරයි. ..........................................

(8) පහත පදවලට ගැළපෙන තනි පදය ලියන්න.
(i) දුර දිග බලා කටයුතු කරන ..........................................
(ii) ගලින් නිමවන ලද ..........................................

(9) පහත පදවලට සමානාර්ථ පද දෙක බැගින් ලියන්න.
(i) සුළඟ - .......................................... ..........................................
(ii) පොත - .......................................... ..........................................

(10) පහත පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(i) එල - .......................................... (ii) සරු - ..........................................

(11) පහත දැක්වෙන පුරුෂ ලිංග නාම පදයට ගැළපෙන ස්ත්‍රී ලිංග නාම පදය ලියන්න.

(i) වලහා - ................................................

(ii) අලියා - ................................................

(12) පද දෙකෙහිම අර්ථය සමාන යුගල පදයක් වන්නේ,

(i) අඟර දඟර (ii) රොඩු බොඩු (iii) ඉහළ පහළ (iv) නඩු හබ

(13) පහත සඳහන් බහු අර්ථ පදවලට අයත් අර්ථ දෙක බැගින් තිත් ඉර මත ලියන්න.

(i) දද - ................................................ ................................................

(ii) දන - ................................................ ................................................

(14) පහත සඳහන් ග්‍රන්ථ නාම අකාරාදි පිළිවෙළට සකස්කර නැවත ලියන්න.

හීන්සැරය, මඟුල් කෑම, අඹයාළුවෝ, මඩොල්දූව

(15) පහත පදවල අර්ථය තිත් ඉරමත ලියන්න.

(i) ශක්‍යතාව - ........................................................

(ii) කළු චරිත - ........................................................

(16) උපමාර්ථයේ නිපාත පද පමණක් යෙදුණු නිපාත පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) තෙක්, වගේ, අයුරු, එව් (ii) බැවින්, විනා, වගේ, විලස

(iii) සේ, වැනි අයුරු, එව් (iv) මිස, වගේ, විලස, බඳු

(17) පහත සඳහන් වාක්‍යය නිවැරදිව පද බෙදා නැවත ලියන්න.

කරවපියාසරසකිකොන්තගංතොටින්

........................................................................................................................................................................

(18) සර්ව නාම පද පමණක් යෙදුණු පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) මම, එය, ඌ, ගුරුතුමා (ii) එය, ළමයා, ඇය, ඔහු

(iii) ඔවුහු, අම්මා, ඇය, නුඹ (iv) මම, අපි, ඇය, ඔවුහු

I **පහත සඳහන් පද්‍යය රචනා කළ කවියාගේ නම තෝරා යටින් ඉරක් අඳින්න.**

(19) පෙර දැක නොමැති මුත් සුන්දරහාමි විසින්
මගෙ තොරතුරු ඇසූ සැටි හිතවතකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්
පිළිගැන්වී ය මට සොම්නස පිරුණු ඇසින්

(i) මහගමසේකර මහතා (ii) පරාක්‍රම කොඩිතුවක්කු මහතා

(iii) විමලරත්න කුමාරගම මහතා (iv) කුමාරතුංග මුනිදාස මහතා

(20) පහත සඳහන් කවියෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

...................................................................... ........................
ඇස්වල දුම් හැපේ
අත්වල පොතු කැපේ
...................................................................... ........................

ලකුණු 2 5 20 = 40

# II කොටස

**I 01, 02, 03, 04 යන ප්‍රශ්නවලට හා 05, 06 යන ප්‍රශ්න දෙකෙන් එකකටත් පිළිතුරු සපයන්න.**

01. **පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(අ) (i) ''දිට්ඨ දාන'' කෙටි කතාවේ රචකයා නම් කරන්න.

(ii) සිංහල සාහිත්‍යයේ දක්නට ලැබෙන උපදේශ කාව්‍ය ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(iii) පුල පෙළ කුසුම ලිය පිය තෙපල රන් කෙඬි

බල සුබ නිමිති පෙර මඟ නැකතටත් වැඩි

යන කවිය සඳහන් කාව්‍ය ග්‍රන්ථය කුමක් ද? ..................................................

(iv) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණ දෙකක් නම් කරන්න.

..................................................

(v) ධීවර භාෂාවේ එන පහත සඳහන් වචනවල අදහස ලියන්න.

(අ) මාරියාව ..................................................

(ආ) ඉයත්තුව ..................................................

(vi) පහත සඳහන් රූඪී පදවල අදහස ලියන්න.

(අ) වැල් වටාරම් - ..................................................

(ආ) උපාසක බළලා - ..................................................

(ලකුණු 06)

(ආ) **පහත සඳහන් ඡේදය වචන 10 - 20 ත් අතර වන සේ සාරාංශ කොට ලියන්න.**

රටක සැබෑ දියුණුව ඇති වීමට එරට පුරවැසියන් බුද්ධිමත් විය යුතුය. ඔවුන් අංග සම්පූර්ණ අධ්‍යාපනයක් ලැබිය යුතුය. අංග සම්පූර්ණ අධ්‍යාපනයෙන් අදහස් කරන්නේ උපාධි ලැබීම හෝ නොයෙක් නොයෙක් විෂයන් ගැන තොරතුරු ඉගනීම නොවේ. ''අධ්‍යාපනය'' යනු ජීවිතයට සෑම අතින්ම සූදානම් කිරීම ය.

(ලකුණු 04)

02. පහත සඳහන් ඡේද කියවා සුදුසු මාතෘකාවක් යොදා වචන 200ට නො අඩු රචනයක් ලියන්න.

(i) පරිසරය සුන්දර කරන තුරුලතා මිනිසා ඇතුළු සියලු සත්ත්වයන්ගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමට උපකාර කරයි.

(ii) කියවීම හොඳ පුරුද්දක් වන අතර දැනුම මෙන්ම යහගුණ ද වර්ධනය කර නැණ ගුණ බෙලෙන් යුතු පුද්ගලයෙක් බිහි කරයි.

(iii) ජන කවිය, ජන ගීය, ජන කතා ආදී සාහිත්‍ය අංග මිනිස් දිවිය යහමඟ යවන්නට මෙන්ම රසවින්දය මනාව ලබාදීමට හේතුවන සුවිශේෂී සාහිත්‍ය අංගයන් ය.

(iv) මතට ලොල් වූ තරුණ පරපුර නිසා අපේ රටේ අනාගත පරිහානිය උදා විය හැකිය. අනාගත සමාජය මතින් මුදවා ගැනීමට නම් අපි සියලු දෙනා එක්ව විසඳුමක් සෙවිය යුතු වෙමු.

(ලකුණු 20)

03. පෙළ පොතේ ඇතුළත් පාඩම් ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ''දැන් අපට පක්ෂ නෑ මේ රටේ කිසි කෙනෙක්''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය කවුරු විසින් කාහට කියන ලද්දේ ද?

(ii) ''හැබෑට? ඉතින් උඹට එහෙදිත් දිනන්න පුළුවන් වෙයි ද?''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් කෙටි කතාව කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය කවුරු විසින් කාහට කියන ලද්දේ ද?

(iii) ''හොඳයි, තමුන්නාන්සේ ඕනෑ කෙංගෙඩියක්'' කරගත්තට කාරි නෑ''

(අ) මෙම ප්‍රකාශය උපුටාගත් පාඩමේ නම ලියන්න.

(ආ) මෙම ප්‍රකාශය කවුරු විසින් කාහට ප්‍රකාශ කරන ලද්දේ ද?

(iv) දෙයක් වේ නම් යම්

සුදුස්සාටම හිමි විය යුතු ....

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් නාට්‍ය නිර්මාණය කුමක් ද?

(ආ) එම නාට්‍ය සිංහල භාෂාවට පරිවර්තනය කළ රචකයා නම් කරන්න.

(v) ජාතිය රන් විමනක් වේ

ආගම මිණි පහනක් වේ

එය රැක ගන්නට මෙලො වේ

සමත් වෙතොත් පුත නුඹ වේ

(අ) ඉහත කවිය රචනා කළ රචකයා නම් කරන්න.

(ආ) එම රචකයා රචනා කළ ළමා පද්‍ය සංග්‍රහයක් නම් කරන්න. ලකුණු 2 5 5 = 10

04. රත්නපුර නෙළුම්දෙණිය මහා විද්‍යාලයේ සේවය කරන තමාරා වීරසිංහ ගුරු මහත්මිය තිස් වසරක ගුරු සේවයෙන් පසු 2019/11/30 දින විශ්‍රාම ගන්නීය. එම ගුරුමහත්මියගේ මහගු සේවයට උපහාර පිණිස එදින පාසලේ උපහාර උත්සවයක් සංවිධානය කර ඇත. එම උත්සවයට ආරාධනා කිරීම සඳහා සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න. ඔබ උත්සව සංවිධාන කමිටුවේ ලේකම් යැයි සිතන්න. ලකුණු 10

05. පහත දී ඇති කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරක බවට හරවා ලියන්න.

(i) කම්කරුවෝ පාලම ඉදි කළහ.

(ii) වෛද්‍යවරයා සායනයට පැමිණියේය.

(iii) මී මැස්සෝ මලින් මලට පියාඹති.

(iv) ධාවන ශූරයා තරගය ජයගත්තේය.

(v) ගායකයෝ රසිකයන් පිනවති. ලකුණු 2 5 5 = 10

06. පහත ප්‍රස්තාව පිරුළුවල අදහස ලියන්න.

(i) (අ) කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බලන්නා සේ

(ආ) පය බරවායට පිටි කර බෙහෙත් බැන්දා වගේ

(ඇ) බල්ලාගේ වැඩේ බූරුවා බාර ගත්තා වගේ

(ii) පහත අදහසට ගැළපෙන ප්‍රස්තා පිරුළ ලියන්න.

(අ) අනුන් රවටන්නට ගොස් තමන් රැවටීම

(ආ) සුදුස්සා නැති තැන නුසුදුස්සා නායකත්වය ගැනීම ලකුණු 2 5 5 = 10

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**Answer**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 9 - 2019

### සිංහල භාෂාව හා සාහිත්‍යය - පිළිතුරු පත්‍රය

## I කොටස

(1) 3

(2) 2

(3) 1

(4) 3

(5) 2

(6) (i) ගායකයෙකු (ii) ළමයා

(7) (i) සමහරෙක් දේශීය නැටුම් කලාවට කැමැත්තක් දක්වති.
(ii) තුරු ලතාවෝ පරිසරය අලංකාර කරති.

(8) (i) දූර දර්ශී (ii) ශෛලමය

(9) (i) පවන, නල, මාරුතය (ii) ගත, ග්‍රන්ථය, පුස්තකය

(10) (i) නිෂ්ඵල (ii) නිසරු

(11) (i) වැලහින්න (ii) කෙනෙර

(12) 4

(13) (i) කොඩි, කුෂ්ඨ, බමුණා, මෝඩ
(ii) ජනයා, දානය, ධනය

(14) අඹ යාළුවෝ, මඟුල් කෑම, මඩොල්දූව, හීන්සැරය

(15) හැකියාව, අයහපත් චරිත

(16) 3

(17) කරව පියාසර සකි කොන්ත ගං තොටින්

(18) 4

(19) 3

(20) ඇස්වල දූම් හැපේ
අත්වල පොතු කැපේ
කඹුරාගේ ළිපේ
වළං කැකුළු පිපේ

ලකුණු 2 5 20 = 40

## II කොටස

01. (අ) (i) ජේ.සී.පී.එස්. සිරිවර්ධන මහතා
(ii) ලෝවැඩ සඟරාව, සුභාෂිතය, සිරිත්මල්දම, ලෝකෝපකාරය
(iii) සැලළිහිණි සංදේශය
(iv) මනමේ, සිංහබාහු, කදා වළලු, පබාවතී, පේමතෝ ජායතී සෝකෝ, වෙල්ල වැහුම්
(v) (අ) මුහුදු රළ (ආ) කාලගුණය
(vi) (අ) අනවශ්‍ය විස්තර (ආ) සුදන වෙස් ගත් දුදනා (ලකුණු 06)

(ආ) නිවැරදි කරුණු සහිත වාක්‍ය
අක්ෂර වින්‍යාස හා පද බෙදීම්
විරාම ලක්ෂණ ආදී නිර්ණායක ගැන සැලකිලිමත් වී ලකුණු ප්‍රදානය කරන්න. වචන ප්‍රමාණය පිළිබඳව ලිහිල් පිළිවෙතක් අනුගමනය කරන්න. (ලකුණු 04)

02. සාරවත් භාවය ලකුණු 5
සංවිධානය, නිර්මාණාත්මක බව ලකුණු 5
ශිල්පීය දක්ෂතා - ලකුණු 5
භාෂා රීතිය - ලකුණු 5

ඉහත නිර්නායක අනුව ලකුණු පිරිනමන්න. මුළු ලකුණු 20

**Answer**

03. (i) (අ) මහාසාර පළඳනාව (ආ) බිසව විසින් රජතුමාට
(ii) (අ) මීටර සියය (ආ) මුදලිහාමිගේ මව විසින් මුදලිහාමිට
(iii) (අ) දිට්ඨ දාන (ආ) විදුහල්පතිතුමා විසින් සිරිසෝම මහතාට
(iv) (අ) හුණුවටයේ කතාව (ආ) හෙන්රි ජයසේන මහතා
(v) (අ) එස්. මහින්ද හිමි (ආ) ළමා කවි කළඹ, ඔවා මුතු, කව්මිණ, කව්මුතු ලකුණු 2 5 5 = 10

04. ආකෘතිය ලකුණු 2
නිවැරදි කරුණු ඉදිරිපත් කිරීම ලකුණු 4
ශිල්පීය දක්ෂතා ලකුණු 2
නිර්මාණාත්මක බව ලකුණු 2 මුළු ලකුණු 10

05. (i) කම්කරුවන් විසින් පාලම ඉදි කරන ලදී.
(ii) වෛද්‍යවරයා විසින් සායනයට පැමිණෙන ලදී.
(iii) මී මැස්සන් විසින් මලින් මලට පියඹනු ලබයි/පියඹෙයි.
(iv) ධාවන ශූරයා විසින් තරගය ජයගනු ලැබීය/ජයගන්නා ලදී.
(v) ගායකයන් විසින් රසිකයෝ පිනවනු ලබති/පිනවෙති. ලකුණු 2 5 5 = 10

06. (i) (අ)
(ආ) යම් ගැටළුවකට කිසිසේත් නොගැළපෙන විසඳුමක් ලබා දීම.
(ඇ) කළ නොහැකි කාර්යයක් කරන්නට ගොස් කරදරයකට පත්වීම
(ii) (අ) ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ
(ආ) ලූලා නැතිවලට කනයා පණ්ඩිතයා වූවා සේ ලකුණු 2 5 5 = 10